3 වන පිටුවෙන් (සර්න් ෆොන්සේකා)

නායකයන් මොන තරම් දූෂණය කළත් ,මොන තරම් වරදේ බැඳුනත්, වරදක් නැතැයි පොදු මහජනතාව සිතීය. දකුණ හැර ඊට පෙර පළාත් සභා ඡන්ද සියල්ල ඔප්පු කර සිටියේ එම යථාර්ථයයි. එහෙත් දකුණෙන් පත්තු වුණු රතු එළිය ඒ තත්ත්වය වෙනසකට භාජනය වී ඇති බව රටට දන්වා සිටී.

මහින්ද රාජපක්ෂ අද දවසේ සිටින ජනප්‍රියතම දේශපාලන නායකයා බව අවිවාදිතය. විපක්ෂයට පවා තම ජයග්‍රහණයන් ගැන ගණන් බලන්නට සිදුව ඇත්තේ ඒ යතාර්ථය මත පිහිටාය. ඔහු ඒ ජනප්‍රිය භාවය උපයා ගන්නේ යුද්ධ ජයග්‍රහණය ඇසුරින් පමණක්ම නොවේ. කලක් තිස්සේ ඔහු පීඩාවට පත් පාර්ශවයන් සමග වංකාව හෝ අවංකව සබඳතා තර කර ගැනීමෙන් හා ඔවුන්ගේ හඬක් බවට පත්වෙමින් ක්‍රියාකාරී වීමෙනි.

ඉතාම සුපිරිසිදු හමුදා නායකයාද? ඉතාම දූෂිත දේශපාලනඥයාද?

පලස්තීන මිතුත්ව සංවිධානයේ දිගු කාලීන සභාපතිවරයා ලෙසත්, 87 - 89 කාලයේ මානව හිමිකම් උදෙසා අවදානම් සහගත ක්‍රියාකාරකම් වල යෙදීම නිසාත්, එමේ ව්‍යාපාරයේ ලබැඳි මිතුරකු ලෙසත්, මහ පොළොවේ ගැවසෙන මිනිසුන් සමග හිරිකිතයක් නැතිව කාලය ගත කිරීම නිසාත් යන කරුණු මහින්ද රාජපක්ෂගේ දේශපාලනික සාධනීයත්වයට බලපෑවේය. දේශපාලන ලෝකයේ මහින්දගේ ඊළඟ ප්‍රතිවාදියා වන රනිල් වික්‍රමසිංහට ඒ ආකාර කිසිම සුදුසුකමක් නැති නමුත් දේශපාලනික ක්‍රමිකත්වය හා පාලනය පිළිබඳ තාර්කික වැටහීමක් ඇත.

එහෙත් ඉදිරියේ ඇති ජනාධිපතිවරණයේදී දේශපාලනඥයන් අතර සටනක දී තරාදියේ මහින්දගේ පැත්ත බර වැඩිවන අතර රනිල්ගේ පැත්ත ඉහළ යනු ඇත. මංගල සමරවීර උපක්‍රමික නායකයා වන විපක්ෂ සන්ධානය අන්ද මන්ද වී සිටින්නේ මේ නියත තත්ත්වයටයි.

මංගල අද සිටින ක්‍රියාකාරී දේශපාලකයන් අතුරින් මම කැමති දේශපාලකයෙකි. චන්ද්‍රිකා ආණ්ඩුවේ ඇමතිකම් කරන සමයේ ඔහු, ඔහුගේ දක්ෂකම් හා නිර්භය බව පෙන්නුම් කළේය. එහෙත් මංගලට මහින්ද රාජපක්ෂ කෙරේ ඇත්තේ සංසාරිකව එන දේවදත්ත වෛරයකි. දේවදත්ත හා සිද්ධාර්ථ දෙපල ප්‍රගුණ කළ විශේෂ හැකියා ඇතිව සිටි දෙපලකි. ගිහිකළ එකට වැළි කෙලියේය. මහින්දට හා මංගලට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙන් දේවදත්තට හා සිද්ධාර්තට ශාක්‍ය වංශය පරිසරය විය. දීපක් චොප්රාගෙ " බුද්ධ" නිර්මාණ කෘතියට අනුව නම් දේව දත්ත හා සිද්ධාර්ථ දෙපලගේ විරසක භාවයට පදනම වන්නේ සුජාතා නම් කුමාරිකාවකි. එ ආකාරයට ගත් කළ මහින්ද මංගල විරසකයේ පදනම සැපයෙන්නේ චන්ද්‍රිකා නම් රැජිනක් කරණකොට ගෙනය.

කෙතරම් සතුරු සිතක් තිබුණත් දේවදත්ත බුද්ධ ශාසනයට ඇතුලු විය. එහි චර්ධනයට තම හැකියාවන් වැය කළේය. ඒ අසූරින්ම මංගලද මහින්ද පාලනයට ඇතුලු විය. එම පාලනය බිහිකර ගැනීමේ සැලකිය යුතු බරක් කරට ගත්තේය. හරියට බුදු සසුනට ගල් පෙරලීමට කලින් දේවදත්ත කළ මෙහෙවර පරිද්දෙනි.

මහින්ද පාලනය දේශපාලනයේදී අනේක විධ වැරදි කරමින් සිටින බව සැබෑවකි. ඒ වැරදි රටේ යහ පාලනය උදෙසා, ඉතාමත්ම නරක ආකාරයට බලපාන බවද සැබෑවකි. මංගල, රාජපක්ෂ පාලනයෙන් ඉවත්ව ගිය දා සිට නිදහසේ වේදිකාව, මාධ්‍ය සාකච්ඡා ආදි සියල්ල මැනවින් පාවිච්චි කරමින් රාජපක්ෂ පාලනය බය නැතිව විවේචනය කරයි. ඒ සඳහා ඔහුට විශාල වන්දියක් ගෙවන්නට වී තිබෙන බවත් සැබෑවකි. මංගල අද සමස්ථ විපක්ෂයට සිටින සෑම අතින්ම දක්ෂ සෙබලාය. එක්තරා ආකාරයකට එවන් හොඳ සෙබළෙක් ආණ්ඩුවට නැති තරමය. මේ සෙබලා වරෙක ගිරවෙකි. වරෙක පුරෝහිතයෙකි. වරෙක කපටි නරියෙකි. ආණ්ඩුවේ නම් මෙතෙක් කලක් පාවිච්චි කරමින් සිටි ගිරවා රෝගීව දුබල වෙමින් සිටින බවක් පෙනේ. ඒ විමල් විරවංශය.

මංගල ප්‍රමුඛ විපක්ෂ සන්ධානය, නිදහසේ වේදිකාව තුළිනුත්, මාධ්‍ය හරහා මත දක්වීම් තුළිනුත්, ආණ්ඩුව උදෙසා කළ බලවත් විවේචන ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් වැදගත් විය. ප්‍රජාතන්ත්‍රවාදයේ අතෘප්‍රාප්‍ය සාධකයක් වන බලගතු විපක්ෂයක් නැති අඩුව මංගල සම්පූර්ණ කරමින් සිටින්නේය යන හැඟීමක් මා තුළ ඇති විය. ඔහු ඔහුගේ කථා තුළින් හත් පොලේ දිවුරමින් කියා සිටියේ තමන් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මේ සියල්ල කරන බවය. එහෙත් එය නිදහසින් පසු බහුතර දේශපාලන නායකයින් කියා සිටි ශෙයින්වලට වැඩි දෙයක් නොවන බව පෙනෙන්නේ තමන්ගේ සංසාරික ප්‍රතිවාදියාට එරෙහිව, මේජර් ජනරාල් සරත් ෆොන්සේකා ඉදිරියට ගැනීමට දරන උත්සාහය නිසාය.

මේ අවස්ථාවේ සරත් ෆොන්සේකා විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස එජාපයේ හා ජනතා විමුක්ති පෙරමුණේ ද සහාය ලදහොත් මහින්ද රාජපක්ෂ හා කරට කර සටනක් දිය හැකි බව සත්‍යයකි. එහෙත් එයින් කවුරු දිනන්නේද? කවුරු පරදින්නේද යන කාරණය පැහැදිලි කිරීමට තවම කල් වැඩිය.

එහෙත් දේශපාලනික අරුතින් මංගල සමරවීර, ජනතා විමුක්ති පෙරමුණ වැනි සුද්ගලයන් හා කණ්ඩායම් ලංකාවේ දේශපාලනයට හමුදා නායකයකු හඳුන්වා දීම උචිතද? මෙය අප ඉදිරියේ ඇති දුවැන්තම දේශපාලනික ප්‍රශ්නයයි.

අපගේ දේශපාලනික ඉතිහාසය සලකා බලලුවහොත්, පසුගිය සියවස පුරාමත් ඊටත් සමා සන්න අඩ සියවසක කාලයකත්, ප්‍රජාතන්ත්‍රවාදය මෙරටෙහි ස්ථාපිත කිරීම උදෙසා විවිධ පුද්ගලයන් හා කණ්ඩායම් උත්සාහ දරීය. බ්‍රිතාන්‍යයටත් පෙර සර්වජන ඡන්දය ලැබීමෙන් ලංකාව ඡන්ද ක්‍රියාකාරීත්වයෙන් අද්විතීය තැනක තිබේ. ඉහළ සාක්ෂර භාවය, නූතන ලෝක දියුණුවේ මට්ටම ඉක්මණින් දිනා ගැනීමට ඇති හැකියාව, සැබැවින්ම සංවර්ධනයේ ධනාත්මක බවක් ඉසිලීම, අප වෙත ලැබුණේ දුර්වල ලෙස හෝ ප්‍රජාතන්ත්‍රවාදය අප රට තුල පවත්වා ගෙන යාම කරණකොට ගෙනය.

හමුදා නායකයකු, හමුදාමය අරුතකින්ම රටේ නායකත්වයට පත් වුවහොත්, ප්‍රරමයෙන්ම හිත තැබෙන්නේ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට බව මංගල සමරවීර, ජනතා විමුක්ති පෙරමුණ, වැනි ප්‍රජාතන්ත්‍රවාදය ගැන කෑ මොරදෙන උදවියට නොපෙනෙන්නේ ඔවුන් සතුව ඇත්තේ යහ පාලනය පිළිබඳ අදහසක් නිසා නොව තමන්ට කෙලවූ මහින්ද රාජපක්ෂට පාඩමක් ඉගැන්වීමට අවශ්‍යය යන කාරණය පමණක් නිසාය.

සරත් ෆොන්සේකාගේ සමස්ත ක්‍රියාකාරී ජීවිතයම ගෙවී ඇත්තේ ආයුධ, දැඩි බව හා හමුදාමය විනය පදනම් කරගෙනය. ඉතින් තිස් වසරක යුද ක්‍රියාදාමය තුළ ඔහු වෙහෙසුනේ මිනිසුන් ජීවත් කරවන්නට නොව මිනිසුන් මැඩලීමටය. ඔහු අයත්වන සමාජ තීරුවට ක්ෂුද්‍ර තත්ත්වයේ ජීවත්වන මිනිසුන්ගේ ක්ෂුද්‍ර අවශ්‍යතා හෝ හැඟීම් ගැන වැටහීමක් හෝ අවබෝධයක් ඇත්තේ නැත. ඔහු වැන්තනන්ට අවශ්‍ය වන්නේ ඉලක්ක ජය ගැනීම මිස තනි තනි පුද්ගලයා සතු ක්ෂුද්‍ර අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීමට නොවේ. මේජර් ජනරාල්වරයා කෙතරම් යහපත් මනුෂ්‍යයකු වුව ද, ඔහු හමුදා සෙබළෙකු වීම කරණ කොටගෙන ඉහත කී තත්ත්වයන්ගෙන් බැහැර විය නොහැක.

ලෝකයේ හමුදා නායකයන් බලයට පත් වූ සෑම අවස්ථාවකදීම පාහේ එරටේ මුල් බැස තිබුණු ප්‍රජාතන්ත්‍රීය ආයතන විනාශ වී ගිය බව අමුතුවෙන් කිව යුතු නොවේ. එය ආසියා අප්‍රිකා ලතින් ඇමරිකා කියා වෙනසක් නොමැත. හමුදා නායකයන් බලයට පත්වූ රාජ්‍යයන් දෙදරුතා දර්ශකයේ ඉහළින්ම සිටින බවද අප අමතක කළ යුතු නොවේ.

මේජර් ජනරාල් සරත් ෆොන්සේකා ලංකාව ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමට පර්යායව ලංකාව දෙමලුන්ගෙන් මුදා ගැනීමේ ව්‍යාපෘතියකට ද නායකත්වය දෙන්නට අපේක්ෂා කරන බව ඔහුගේ 'නැෂනල් පෝස්ට්' කුප්‍රකට සම්මුඛ සාකච්ඡාවෙන් පෙනේ. එහිදී ඔහු පවසා සිටියේ ලංකාව සිංහලයන්ගේ රට බවත්, අනෙකුත් ජාතීන්ට එහි ජීවත්විය හැක්කේ මහා ජාතියේ හිත හොඳකම මත ඔවුන්ගේ ආශිර්වාදය යටතේ පමණක් බවත්ය. මෙය දේශපාලනිකව ඉව අල්ලන්නකුගේ ප්‍රකාශයක් හැර අන් කවරක්ද? ලංකාව නිදහස් අරගලයක් යයි කිව හැකි වැදගත් ක්‍රියාවලියක් නොතිබූ නිසාම, සුද්දන් ලබාදී ගිය වැදගත් සමහර දේවල් විකෘති ලෙස හෝ අපට පවත්වාගෙන යාමට සිදුවිය. ඡන්ද බලය, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පද්ධතිය, ඒ යටතේ විජිත භාවයෙන් අපට ලැබී ඇති දායාදයන්ය. මාධ්‍ය මර්යනය කරන විට, මහජන මුදල් දූෂණය කරනවිට, මාධ්‍ය සාකච්ඡා, නිදහස් වේදිකා, ඉදිකළ හැක්කේ සුද්දන් ලබාදුන් ප්‍රජාතන්ත්‍රවාදයේ නටබුන් හෝ තවමත් ඉතිරිව තිබෙන නිසාය.

සරත් ෆොන්සේකා කරලියට ගෙන ඒමට ජනතා විමුක්ති පෙරමුණ දරණ උත්සාහය එම පක්ෂය දේශපාලනිකව වල්මත්වී ඇති තත්ත්වයේ මට්ටම කියාපායි. උචිත අනුචිත හැම තැනකදීම, මාක්ස්වාදයේ සරල පාඨ උච්චාරණය කරන මුත් එහි ගැඹුර තම චිත්ත සන්තානයට ඇතුළු කරගත් බවක් ජනතා විමුක්ති පෙරමුණ ආරම්භයේ සිටම නොපෙන්වීය. එය කෙතරම් විසුලු සහගත ලෙස උපයෝගි කර ගත්තේ ද යත් ජනතා විමුක්ති පෙරමුණෙන් මෑතකදී නික්ම ගිය විමල් වීරවංශගේ "නැත්ත වෙනුවට ඇත්ත" කෘතියම සාක්ෂි දරයි.

මාක්ස්වාදියකු වීමට වඩා ජාතිවාදියකු වීම වඩාත් පහසුය. විශේෂ දේශපාලන ධාරාවකට අයත් නොවන සිංහල ගැමි පවුලක හෝ පහල මධ්‍යම පාංතික පවුලක උපත ලද ඕනෑම කෙනෙකුට බඩගින්න, පිපාසය, සිංහල කීමේ ලිව්මේ හැකියාව මෙන්ම තමන් අයත් කුලය, ආගම හා ජාතිය ගැන ඇතිවන හැඟීම උත්පත්ති සාධකයන්ය. තවත් ජාතියකට ගරු කරන්නට, යට කී හැඟීම් ශීලාචාර ලෙස පොදු සමාජ සම්මුතීන් තුළ ජය ගන්නට නම් බාහිර දැනුම ලැබීම අවශ්‍යය. එසේ නොවන්නෝ ජාතිවාදීන්, කුලවාදීන්, ආගම්වාදීන් ලෙසම හැඳී වැඩී මැරියනු ඇත. ජනතා විමුක්ති පෙරමුණටද මාක්ස්වාදී දැනුම සම්භාරය ඇත්තේ ඔවුන්ගේ අභ්‍යන්තර දැනුම පද්ධතියක් ලෙස නොව බාහිර සැරසිල්ලක් ලෙසය. ඔවුන්ගේ අභ්‍යන්තරයේ ඇත්තේ ජාතිවාදය, ආගම්වාදය වැනි තිරස්චීන ධර්මතාය. ඔවුන්ට පාසුවෙන් මේජර් ජනරාල් වරයකු වෙනුවෙන් අත එසවිය හැක්කේ ඒ නොගැඹුරු දේශපාලන දක්ෂ නිසාය.

මංගල සමරවීර ඒ අතින් නූතන මිනිසෙකි. හැඳී වැඩුනු පරිසරය තුළින්ම ඔහුට ජාතිවාදයෙන් බැහැරවිය හැකි විය. ඔහුට ලිංගික අයිතීන් වෙනුවෙන් පවා පෙනී සිටිය හැකි පුළුල් හදවතක් සතුය. එහෙත් මහින්ද රාජපක්ෂ පාලනය කෙරේ වන දේවදත්ත වෛරය, ඒ පුළුල් හදවතටවත් දරාගත නොහැකි තරමය.

මහින්ද රජපක්ෂ මහතා සිය ඥාතීන් පදනම් කරගෙන ගෙනයන පාලනයට වඩා අතිශය තිරස්චීන ලෙස චන්ද්‍රිකා විසින් දේශපාලකයන් නොවන ලද බොළඳ මිතුරන් පදනම් කරගෙන, පාලනයක් ගෙන ගියාය. එදා මංගලගෙ " ආශිර්වාදය ලැබුණේ ඒ කාලයේ කලකිරීමකට පත් තම හිතවත් දේශපාලකයන්ට නොව, චන්ද්‍රිකාගේ කාළකණ්ණි මිතුරු පාර්ශවයටය.

එහෙයින් අද හමුදා ජනරාල්වරයකු රටේ නායකයා කිරීමට මංගල දරණ උත්සාහයේ කෙළවර පවතින්නේ දේශපාලනයේ නොව පුද්ගලික තැනකය. එවන් තැනකට රටේ අනාගතය ගෙනෙන කිරීම කවරකුට හෝ සමාව දිය නොහැකි වරදකි.

අවසන් වශයෙන් මේ ලියන මම එකක් කියමි.

"ඉතාම සුපිරිසිදු හමුදා නායකයකු යටතේ පාලනය වනවාට වඩා, ඉතාම දූෂිත දේශපාලනඥයකුගේ යටතේ පාලනය වීමට මම වඩා කැමති වෙමි."

උපුටාගැන්ම - ලංකා ඊ නිව්ස්

[redacted]

26 වන පිටුවෙන් (සීගිරි ගීයෙහි)

ඔවුන් ගල් කිත්තියක් මත ඇඳි සිතුවම් පමණි" නමුත් මෙම සත්‍ය පසිලි විසින් ගෙන හැර දක්වන්නේ සීගිරි කතක විසින්ම දක්වන හේතු දැක්වීමක් ලෙසිනි. යථාර්ථයත් කාව්‍යමය පරිකල්පනාවත් අතර දෝලනය වන මෙම ගීය උභය භාෂාලංකාරය යෙදුණු අපූරු නිර්මාණයක් වන බව අප හට සාක්ෂාත් වේ.

විරෝධාලංකාරයෙහිදී විරුද්ධ අදහස් එකම කාව්‍ය සංකල්පනාවක් තුළ ගෙන හැර දැක්වීමක් සිදුවේ. අප සිත්සතන්හි පවතින ඇතැම් ආශාවන් වඩාත් අගනා ඒවා ලෙස අපට හැඟෙන්නේ ඒවා ලබා ගැනීමට යම් බාධාවක් ඇති විටය. සීගිරි ළදනාවන්ට පෙම් බැඳි කාට වුවද ඇති ප්‍රධානතම බාධාව නම් ඔවුන් ඉඟියකින් හෝ වදනකින් හෝ ප්‍රතිචාරයක් නොදැක්වීමයි.
"වැනි වැ තම දස් වි ඇති ද සිත තද වන්නේයි. තද සිත හො ද ඇති මෙසේ සිතින් නො තොර් වන්නෙයි."

කෙනෙක් ඇගේ දාසයෙකු බවට පත්වී ඇති නමුත් ඇගේ සිත තද වන්නේය. ඕ තද සිත් ඇත්තියක වුවද කෙනෙකුගේ සිතින් ඉවත් නොවන්නීය.

ඇයට පෙම් බඳින්නෝ ඇගේ දාසයෝ මෙන් හැසිරෙති. ගල් හිතක් ඇති ඇගෙන් ඔවුන්ට කිසිදු ප්‍රතිචාරයක් නොලැබෙයි. නමුත් ඇ කෙරෙහි ඇති ඇල්ම මේ තද හිත නිසා හෝ හීන නොවේ. විරෝධාලංකාරය (oxymoron) තුළින් කාව්‍ය සැරසෙන ආකාරය මෙනයින් අපට ගම්‍යමාන වේ.

යම් කරුණක් සනාථ කිරීම සඳහා ඒ හා සමගාමී වන වෙනත් කරුණු කිහිපයක් ගෙන හැර දක්වීමද කාව්‍ය ලෝකයේදී අලංකාරයක් වශයෙන් සැලකේ. මෙය අර්ථාන්තරන්‍යාස අලංකාරය (අර්ථාන්තරන්‍යාසාලංකාරය) නමින් හැඳින්වේ. මහනා-පව විහාරයෙහි විසු දළමෙයගේ ගීය මේ සඳහා කදිම නිදසුනකි.

"මුහුදැ ගිනිපෙත් ගැසිග නියගින් මැණික් විද
ලි
තිප්ලි වැලැ කපුරු යෙග මුසුන අසරු යි කා
සිනී." (427)

සීගිරි කුරුටු ගී රචකයින්ගෙන් බොහෝ දෙනා සීගිරි ලදනාවන්ගේ ආශ්‍රය පැතුවෝ වූහ. නමුත් දළමෙය ඔවුන්ගේ අදහසට සරුම් කරයි. "මුහුදෙහි ගිනිමැල ගසනු ලබයි; නිය අගින් මැණික් විදිනු ලබයි; තිප්පිලි වැලෙහි කපුරු සැදෙයි;" යනුවෙන් සිදුවිය නොහැකි සිදුවීම් ත්‍රිත්වයක් පිළිබඳව දක්වමින් කවියා සාධනය කිරීමට උත්සහ දරන්නේ ඒ කරුණු අනුව මේ කාන්තාවන් සමග ආශ්‍රය අපට නොගැලපෙන බවයි.

මේ අනුව සීගිරි කුරුටු ගී තුළ ගැබ් කළ කාව්‍ය අලංකාරයන් කෙතෙක් දුරට සාර්ථකව යොදනු ලැබ ඇතිද යන්න අප හට මැනවින් සාධනය වේ. නමුත් අපගේ අවධානය යොමුවිය යුතු තවත් සුවිශේෂී කරුණක් ඇත. මෙම ගේය පද රචනාවන් රචනා කරනු ලැබුවේ ක්‍රි.ව.6-8 දක්වා කාලය තුළ සීගිරියේ සිරි නැරඹීමට ලංකා දීපයේ සතර දිගින් මෙහි පැමිණි සාමාන්‍ය ගැමි ජනයා විසින් බව අප නිරන්තරයෙන්ම සිහි කැඳවිය යුතුය. මන්ද, අදින් වසර දහසකටත් වඩා වැඩි අතීත යුගයකදී ලංකීය ගැමියා සතුවූ භාෂා සහ සාහිත්‍ය අවබෝධය පිළිබඳව ලොවට කියාපෑමට අප සතුව ඇති වටිනාම සාක්ෂිය එය වන බැවිනි.

[redacted]